සියලු ම හිමිකම් ඇවිරිණි. / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Department of Education - NWP

දෙවන වාර පරීක්ෂණය - 07 ශ්‍රේණිය - 2024
Second Term Test - Grade 07 - 2024

# තොරතුරු හා සන්නිවේදනය තාක්ෂණය

කාලය
පැය 01 විනාඩි 30

නම / විභාග අංකය:

## A කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 10 තෙක් ඇති ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. මධ්‍ය සැකසුම් ඒකකයේ වේගය මනිනු ලබන ඒකකය වන්නේ
(1) පික්සල් (2) හර්ට්ස් (3) නැනෝ (4) තප්පර

02. පළමු වදන් සැකසීමේ මෘදුකාංගය වන්නේ,
(1) Microsoft Word (2) Word Star (3) Word Perfect (4) Writer

03. පරිගණක ක්‍රීඩා (Computer games) යනු,
(1) දෘඩාංගයකි (2) මෘදුකාංගයකි (3) තොරතුරකි (4) වෛරස් වැඩසටහනකි

04. පරිගණකයක ඇති UPS මගින් සිදුවන්නේ,
(1) දත්ත තොරතුරු ඇතුලත් කිරීමයි
(2) පරිගණක උපාංගවලට විදුලිය අඛණ්ඩව ලබා දීමයි
(3) පරිගණක තොරතුරු ගබඩා කර තබා ගැනීමයි
(4) පරිගණක උපාංග පාලනය කිරීමයි

05. පරිගණක පද්ධතියේ අභ්‍යන්තරයේ ඇති ප්‍රධාන ආවයන උපාංගය වන්නේ,
(1) පරිගණක තිරය (monitor)
(2) දෘඩ තැටිය
(3) යතුරු පුවරුව
(4) මූසිකය

06. අපට අවශ්‍ය තොරතුරු පරිගණකයෙන් දෘඪ පිටපතක් ලෙස ලබා ගත හැකිවන්නේ,
(1) CD මගිනි (2) මුද්‍රණ යන්ත්‍ර මගිනි (3) පරිගණක තිරය මගිනි (4) ස්පීකරය මගිනි

07. දෙවන පරම්පරාවේ පරිගණකයන්හි වේගය මනින ලද්දේ
(1) පිකෝ තප්පර වලිනි
(2) මයික්‍රෝ තප්පර වලිනි
(3) මිලි තප්පර වලිනි
(4) නැනෝ තප්පර වලිනි

08. යතුරු පුවරුවක ඇති මෙහෙයුම් (Control Keys) යතුරක් වන්නේ,
(1) end (2) Ctrl (3) Y (4) space bar

09. දෘඩාංගයක් නොවන්නේ

(1) ලිනක්ස් (2) තීරුකේත කියවනය (3) මොනිටරය (4) පෑන් ධාවකය

10. ආයතනයක පරිගණක භාවිතය නිසා ඇතිවිය හැකි ප්‍රතිඵලයක් වන්නේ,

(1) නිවැරදිතාවය ඉහල යයි (2) කාර්යක්ෂමතාවය ඉහල යයි

(3) කඩදාසි භාවිතය අඩුවෙයි (4) සියල්ලම සිදුවෙයි

- **අංක 11 සිට 15 දක්වා වූ ප්‍රශ්නවලට දක්වා ඇති A හා B තීරු යා කරන්න.**

| A | | B |
|---|---|---|
| 11. මෘදුකාංගයකි | a | Ubuntu |
| 12. දත්ත ගබඩා කරන උපාංගයකි | b | Tab |
| 13. ශබ්ද ප්‍රතිදාන උපාංගයකි | c | PowerPoint |
| 14. මෙහෙයුම් පද්ධතියකි | d | Headset |
| 15. යතුරු පුවරුවේ යතුරකි | e | CD |

- **අංක 16 සිට 20 දක්වා වූ ප්‍රශ්න සත්‍ය නම් (√) ලකුණද, අසත්‍ය නම් (X) ලකුණද යොදන්න.**

16. Folder එකක් තුළ තවත් Folder සෑදිය හැකිය. ( )

17. .mp3 යනු වීඩියෝ පටයක් සුරක්ෂිත කළ පසු දැකිය හැකි ගොනු දිගුව (file extension) වේ. ( )

18. ගිනි පවුරු භාවිතයෙන් අනිශ්ට මෘදුකාංග වලින් සිදුවන හානිය අවම කර ගත හැක ( )

19. පිළි ඔත්තු මෘදුකාංගය අනිශ්ට මෘදුකාංගයකි ( )

20. UPS මගින් පරිගණකයට ඇතුළත් කරන ලද දත්ත තොරතුරු බවට පත් කිරීම සිදුවේ. ( )

## B කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

01. පහත දැක්වෙන එක් එක් ආවයන උපාංග වර්ග සඳහා උදාහරණ 02 බැගින් ලියන්න

A - චුම්භක මාධ්‍ය උපාංග

.................................................... ....................................................

B - ප්‍රකාශ මාධ්‍ය උපාංග


.................................................... ....................................................

C - ඝන තත්වයේ උපාංග

.................................................... ....................................................

02. සෘජුකෝණාස්‍රයක වර්ගඵලය සෙවීම සඳහා ලියන ලද පහත සඳහන් ගැලීම් සටහනේ හිස්තැන් පුරවන්න

(වර්ගඵලය , දිග , ආරම්භය , පළල , අවසානය , දිග * පළල)




03. I. දෘඩාංග ආරක්ෂා කර ගැනීමට ගතහැකි පියවර 3ක් ලියන්න

A ....................................................................................................

B ....................................................................................................

C ....................................................................................................

II. මෘදුකාංග ආරක්ෂා කර ගැනීමට ගතහැකි පියවර 3ක් ලියන්න

A ........................................................................................................

B ........................................................................................................

C ........................................................................................................

04. I. මධ්‍ය සැකසුම් ඒකකයේ ප්‍රධාන කොටස් 3 නම් කරන්න

A ........................................................................................................

B ........................................................................................................

C ........................................................................................................

II. පරිගණක මෙහෙයුම් පද්ධති 3ක් ලියන්න

A ........................................................................................................

B ........................................................................................................

C ........................................................................................................

III. මෙහෙයුම් පද්ධතියක කාර්යයන් 3ක් ලියන්න

A ........................................................................................................

B ........................................................................................................

C ........................................................................................................

05. I. ගොනුවක් යනු කුමක්ද? නිදසුනක් ලබා දෙන්න

........................................................................................................

........................................................................................................

........................................................................................................

........................................................................................................

II. ගොනු ගුණාංග 3 ක් ලියන්න

A ........................................................................................................

B ........................................................................................................

C ........................................................................................................